# (උ) ගෙවුම් ශේෂය සහ විදේශීය වත්කම්[1]

## 1. හැඳින්වීම

ආනයන ප්‍රමාණය කෙරෙහි දැඩි සීමා කිරීම් පැනවීම, ද්‍රව්‍ය හුවමාරුවෙහි අවාසිදායක ශේෂය, අපනයන ඉපැයීම් හා ආධාරවලට අනුකූල මට්ටමකට සීමා කිරීම පිණිස නැවත වරක් ඉවහල් වී ඇත. වෙළෙඳ භාණ්ඩ ගිණුමෙහි හිඟය රුපියල් දශලක්ෂ 302 ක් විය. විදේශීය රාජ්‍යයන්ගෙන් ලැබුන දීමනා මගින් වර්තන ගිණුමේ හිඟය රුපියල් දශලක්ෂ 269 දක්වා අඩු කර ගත හැකි විය. රුපියල් දශලක්ෂ 294 ක්වූ ශුද්ධ ප්‍රාග්ධන ගලා ඒම (ප්‍රධාන වශයෙන් ද්‍රව්‍යාධාර හා යෝජනා ක්‍රම ණය මුදල්වල ස්වරූපයෙන්) වර්තන ගිණුමේ හිඟය පියවාලීමට අවශ්‍ය ප්‍රමාණයටත් වඩා වැඩි තරම් විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් "මූලික ශේෂයෙහි"[2] තවත් වරක් රුපියල් දශලක්ෂ 25 ක අතිරික්තයක් ඇති විය.

කෙසේ වුවද ඉකුත් වසර හා සසඳන කළ 1972 දී ගෙවුම් ශේෂයෙහි ක්‍රියාකාරිත්වය අසතුටුදායකය. 1971 දී "මූලික ශේෂයෙහි" අතිරික්තය රුපියල් දශලක්ෂ 188 ක් තරම් අධික විය. මූලික ශේෂය නරක අතට හැරීමට ප්‍රධාන හේතුව වූයේ ආධාර ගලා ඒම අඩු වීමය. දීමනා රුපියල් දශලක්ෂ 24 කින් පහත වැටුන අතර දිගුකාලීන ශුද්ධ ආධාර ගලා ඒම රුපියල් දශලක්ෂ 111 කින් අඩු විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1971 දී මෙන් නොව, මූලෝපාය ගෙවීම් සඳහා කෙටිකාලීන ණය මත රටෙහි රඳා පැවැත්ම යම් ප්‍රමාණයකින් අඩු කර ගත නොහැකි විය.

### II (උ) 1 වැනි සංඛ්‍යා සටහන
### ලංකාවේ ගෙවුම් ශේෂය

රුපියල් දශ ලක්ෂ

| වර්ෂය | වෙළෙඳ ශේෂය | සංක්‍රාම ගෙවුම් ඇතුළුව ශුද්ධ සේවා | ජංගම ගිණුමේ ශේෂය | ශුද්ධ දිගුකාලීන ප්‍රාග්ධනය | මූලික ශේෂය |
|---|---|---|---|---|---|
| 1957 | - 95 | - 100 | - 195 | - 18 | - 213 |
| 1958 | - 89 | - 64 | - 153 | + 8 | - 145 |
| 1959 | - 183 | - 25 | - 208 | + 32 | - 176 |
| 1960 | - 210 | - 11 | - 221 | + 22 | - 199 |
| 1961 | - 86 | - 7 | - 93 | + 11 | - 82 |
| 1962 | - 143 | + 3 | - 140 | + 39 | - 101 |
| 1963 | - 161 | - 7 | - 168 | + 80 | - 88 |
| 1964 | - 193 | + 33 | - 160 | + 8 | - 152 |
| 1965 | - 13 | + 72 | + 59 | + 58 | + 117 |
| 1966 | - 344 | - 53 | - 290 | + 137 | - 153 |
| 1967 | - 335 | + 46 | - 289 | + 161 | - 128 |
| 1968 | - 380 | + 25 | - 355 | + 224 | - 131 |
| 1969 | - 746 | - 51 | - 797 | + 275 | - 522 |
| 1970 | - 315 | - 35 | - 350 | + 184 | - 166 |
| 1971 | - 287 | + 71 | - 216 | + 404 | + 188 |
| 1972(අ) | - 302 | + 33 | - 269 | + 294 | + 25 |

(අ) තාවකාලිකයි.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

1972 ක්‍රියාකාරිත්වය, 1971 දී තරම් සතුටුදායක නොවීම හැරුණු විට නොසන්සුන් බවක් ඇති කරවන සුළු තවත් කරුණක්ව ඇත්තේ ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂයෙහි බොහෝ කලක සිට පවත්නා දුර්වලතාවයට තුඩු දුන් සාධකයන් නොකඩවාම විද්‍යමානවීමයි. ශ්‍රී ලංකාවේ ආනයනයන්ගේ මිළ බොහෝ අධික ලෙසින් ඉහළ නැගෙන අතර, එසේ වීමේ හේතූන් බොහොමයක් මෙරටට වළකාලිය හැකි ඒවා නොවේ.

---

1. 1972 අවසාන කාර්තුවේදී වෙළෙඳ බැංකුවල දිග්ගැසී ගිය වැඩ වර්ජනය හේතු කොට ගෙන ගෙවුම් ශේෂය තක්සේරු කිරීමේදී ඉකුත් වසරේ යොදගත් ක්‍රමවලට වඩා වෙනස් ක්‍රම යොද ගැනීමට සිදු විය. ඉකුත් වර්ෂවලදී ගෙවුම් ශේෂ ඇස්තමේන්තු තක්සේරු කිරීම් සඳහා වෙළෙඳ බැංකුවල විදේශීය ගනුදෙනු පිළිබඳ පූර්ණ විස්තර ලබා ගත හැකි විය මෙම වාර්තාව ලියන කාලය වන විට 1972 වසර සඳහා වූ එකී සවිස්තර තොරතුරු ලබා ගත හැකි වූයේ වසරේ ප්‍රථම භාගය සඳහා පමණකි. තොරතුරු පිළිබඳව වූ ඌනතාවය ප්‍රතික්ෂේපන මගින් පිරිමසා ගැනීමට සිදුවිය. මේ නිසා 1972 වසර සඳහා වූ තක්සේරු කිරීම් බොහෝ සෙයින් තාවකාලික ඒවා ලෙස සැළකිය යුතුයි.
2. ශුද්ධ දිගුකාලීන ප්‍රාග්ධන ලැබීම්වලට වර්තන ගිණුමෙහි ශේෂය හිලව් කිරීම මගින් 'මූලික ශේෂය' ලබා ගෙන ඇත.

එම හේතූන් නම් :-

( i ) දියුණු රටවල වේතන මිළ උද්ධමනය නිසා ශ්‍රී ලංකාව ආනයනය කරන නිමැවූ භාණ්ඩවල මිල වැඩිවී තිබීම.

( ii ) සිය ඛණිජ තෙල් අපනයනයන් සඳහා වඩා හොඳ මිලක් ලබා ගැනීමට තෙල් නිෂ්පාදනය කරන රටවල් මගින් කරන ලද සාර්ථක බලපෑමේ ප්‍රතිඵලයක් වශයෙන් ඛණිජ තෙල් නිෂ්පාදිතයන්හි මිල තියුණු ලෙස ඉහළ යාම.

( iii ) වසර මුළුල්ලේම සැපැයුම අඩුව පැවැති සීනි සහ වසරේ අවසාන කාර්තුව තුළ සැපැයුම අඩුව පැවැති සහල් හා තිරිඟු වැනි ඇතැම් ආහාර ද්‍රව්‍යයන්හි මිල වැඩිවීම.

( iv ) ශ්‍රී ලංකාව සිය ආනයනයන් සඳහා මුදල් යෙදවීම පිණිස කෙටිකාලීන හා දිගුකාලීන ණය මත වඩ වඩා යැපීම සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් සිය අපනයනයන් අඩුම මිලට ලබා ගත හැකි රටවලින් ඒවා ලබා ගැනීමට ඇති හැකියාව හීනවීම.

ආනයන මිළ නිරතුරුවම ඉහළ යාම ශ්‍රී ලංකාවේ විදේශීය සම්පත් කෙරෙහි සැළකිය යුතු බලපෑමක් ඇති කිරීමට හේතුවී තිබෙන අතර පසුගිය වසර කීපය තුළදී පීඩනයන් ගෙන දෙන කරුණු අළුතින් ඉස්මතුවී ඇත. ශ්‍රී ලංකාව මගින් කලින් ලබාගත් ණය සඳහා වන පොළී ගෙවීම් 1972 සිය අපනයන ඉපයුම්වලින් සියයට 6 කට වැඩි විය. දිගුකාලීන ණයෙහි ප්‍රාග්ධන ආපසු ගෙවීම් සඳහා තවත් සියයට 6 ක් අවශ්‍ය විය. මීට අමතර වශයෙන්, අළුතින් ණය ගැනීමෙන් කෙටිකාලීන ණය විශාල ප්‍රමාණයක් ක්‍රමවත් කළ යුතුව ඇත.

දිගුකාලීන වශයෙන් සළකන කළ පසුගිය වර්ෂ කීපය තුළ අපනයන ඉපයීම් නිශ්චලනව පැවතීම වඩාත් අසතුටුදායක සාධකය වෙයි. රුපියල් අනුව සලකන විට 1972 දී අපනයන ඉපයීම්හි සියයට 1·6 ක වැඩිවීමක් සිදු වූවද ඊට බොහෝ සෙයින්ම හේතු වූයේ විනිමය අනුපාතිකයන් ගැළපුම් කිරීමය. විදේශීය ව්‍යවහාර මුදල් අනුව සලකන විට අපනයන ලැබීම්වල ඇත්ත වශයෙන්ම සුළු පහළ වැටීමක් සිදු විය. මෙයට මූලික වශයෙන් හේතු වූයේ අපනයනය කළ තේ ප්‍රමාණය අඩුවීමය. 1971 දී නිමැවුම් පහත වැටීම ත්‍රස්තවාදී කටයුතුවලින් ඇති වූ බාධාවන් නිසා සිදු වූවා විය හැකි අතර, 1972 දී අහිතකර කාලගුණ තත්ත්වයන් තරමක් දුරට එයට හේතු වූවා විය හැකිය. කෙසේ වෙතත් නිෂ්පාදකයන් විසින් සිය මෙහෙයවුම් වියදම් අර පිරිමසා ගැනීමට ගත්තා ලද ව්‍යායාමය, තේ සහ රබර් අපනයනයෙහි පරිමාව පහළ වැටීමට තරමක් දුරට හේතු සාධක වූ බවට දෙස් දෙන කරුණු දැකිය හැකිය. ශ්‍රී ලංකාව සිය අපනයන ඉපයීම්වලින් සියයට 73·1 ක්ම සඳහා මෙකී කර්මාන්ත දෙක මත දිගින් දිගටම යැපෙන්නටවීම සැළකිල්ලට භාජනය කළ විට, මෙහි ඉතාමත් නොසන්සුන් බවට තුඩු දෙන උපනතියක් පිළිබිඹු වේ.

1972 වසරේ අයහපත් තත්ත්වය පිළිබඳව සතුටු විය නොහැකි තවත් හේතුවක් නම්, එකී වර්ෂය පස් අවුරුදු සැලැස්මෙහි ප්‍රථම වර්ෂය වීමය. ශ්‍රී ලංකාව පත්ව ඇති තත්ත්වයේ රටක්, ආනයන ආදේශනය මත පමණක් රැඳීමේ ප්‍රතිපත්තියක දිගුකාලීන වශයෙන් ඇති වන සීමාවන් අවබෝධකර ගැනීම නිසා පස් අවුරුදු සැලැස්ම, අපනයන වර්ධනය වේගවත් කිරීමෙහි ලා අවධාරනයෙන්ම සැළකිලිමත්වී ඇත. සැලසුම් කාලය අවසානයේදී මුළු අපනයන ඉපයීම් රුපියල් දශලක්ෂ 2,710 දක්වා වැඩිවෙතැයි බලාපොරොත්තු වනු ලැබේ. අපනයන ඉපයුම් සම්බන්ධයෙන් වාර්ෂිකව ඉලක්කයන් නියමකර නැති මුත්, සැළකිය යුතු අපනයන ඉපයීමක් නොමැතිව වසරින් වසර ගෙවී යාම නිසා 1976 අවසානයේදී රුපියල් දශලක්ෂ 2,710 ක් ඉපයීමේ කාර්යය වඩාත් දුෂ්කර වනු ඇත. පස් අවුරුදු සැලැස්මෙන් බලාපොරොත්තු වන ආයෝජනයන් සඳහා අවශ්‍ය මුදල් සැපයීමේ හැකියාව රඳා පවත්නේ, අවශ්‍ය විදේශීය විනිමය ලබා ගැනීමට ඇති හැකියාව මතය. එබැවින් අපනයන ඉලක්කයන්හි පහත වැටීමක් සිදුවුවහොත් එය සැලැස්මේ සාර්ථකත්වය කෙරෙහි බලවත් ප්‍රතිවිපාක ගෙන දෙනු ඇත.

අත්‍යාවශ්‍ය නොවන පාරිභෝගික ආනයන තවදුරටත් සීමා කිරීම සහ අපනයන දිරිගැන්වීම් වැඩිකරලීමට අනුකූල ප්‍රතිපත්ති කෙරෙහි මෙම තත්වය යටතේ අවශ්‍යයෙන්ම සැළකිලිමත් විය යුතුය. 1972 දී මෙම අංශ දෙකෙහිම කිසියම් ප්‍රගතියක් දක්නා ලදී. පැවතගෙන ආ සම්ප්‍රදයට අනුව රුපියලේ විනිමය අනුපාතිකය රන් පවුම හා ස්ථිරව පවතින සම්බන්ධතාවයකින් නිර්ණයවීමට ඉඩ හළ යුතුද, නොඑසේ නම්, එ. ජ. ඩොලරයට ලංකාවේ රුපියල අළුතින් ඈඳිය යුතුද යන්න, එ.ජ. ඩොලරය සංචලනය වූ 1971 අගෝස්තුවේදී, ශ්‍රී ලංකා රජයට තීරණය කිරීමට සිදුවිය. රන් පවුම සමග තවත්දුරට ඈඳා තැබීමට පක්ෂව පැවති ප්‍රධාන තර්කය වූයේ, රන් පවුම්කලාපයත් සමග ශ්‍රී ලංකාව සෑහෙන තරම් ප්‍රමාණයක වෙළෙඳාමක යෙදීමය. රන් පවුම සමග ඈඳීමක් ඇති කර ගැනීම රන් පවුම් කලාපය වෙත වූ අපනයනයන්ගේ රුපියල් ලැබීම සහ ඒ කෙරෙන් වූ ආනයන සඳහා වූ රුපියල් ගෙවීම් ස්ථාවරව පවත්වා ගැනීමට උපකාරයක් වන්නට ඉඩ තිබුණි. එසේම. ඩොලරය සමඟ ඈඳීමක් ඇතිකර ගැනීමට පක්ෂව මීටත් විට, ප්‍රබල තර්කයක් විය. සංචලනයට පසුව, රන්පවුම අනුව ගත් කල ඩොලරය ක්ෂය වූ වඩා රුපියල සහ රන් පවුම අතර ස්ථිර සම්බන්ධතාවයක් පවත්වා ගෙනයාම හේතු කොටගෙන ඩොලරය අනුව රුපියලෙහි අගය ඉහළයාමට ඉඩ තිබුණි. එසේ වූයේ නම් එහි ප්‍රතිඵලය වනු ඇත්තේ, ඩොලර් කලාපය වෙත අපනයන යවන ශ්‍රී ලංකාවේ අපනයන කරුවනට සිය අපනයන සඳහා අඩු රුපියල් ප්‍රමාණයක් ලැබිය හැකි වීම වන අතර, ඩොලර් කලාපයෙන් කෙරෙන ආනයන, රුපියල් අනුව ලාභදායක වීමය. ගෙවුම් ශේෂ තත්ත්වය අතින් බලන කල මෙකී ප්‍රතිඵලයන් දෙකින් එකක්වත් හිතකර නොවනු ඇත. ඩොලරයට රුපියල ඈඳීම පිළිබඳ තවත් වැදගත් තර්කයක් වනුයේ, ශ්‍රී ලංකාව සමග අපනයන වෙළෙඳ පලවල්වල තරඟයට බැස සිටින රටවල් කිපයක්ම ඩොලරය අනුව යාමය. මෙම කරුණු රජය මගින් සුපරීක්ෂාකාරීව සලකා බැලීමෙන් පසුව 1971 නොවැම්බර්යේදී ඩොලරයට අනුව විනිමය අනුපාතිකයෙහි ගැලපිළි ඇති කිරීමට තීරණය කරන ලදී. ස්මිත්සොනියන් ගිවිසුමත් සමඟ ඩොලරයේ සංචලනය වීම අවසන්වූ කල්හි. එ.ජ. ඩොලරයත්, රුපියලත් අතර කලින් පැවති සම්බන්ධතාවය අනුව අළුත් විනිමය අනුපාතිකයන් නියම කරන ලදී.

1972 ජූනි මාසයේදී රන් පවුම සංචලනය වන්නට ඉඩහල කල්හි යටකී තීරණයන් වහා සමාලෝචනය කිරීමට සිදු විය. රන් පවුමට රුපියල ඈඳිය යුතු යයි කලින් දක්වූ තර්කයන් සියල්ලම මේ සම්බන්ධයෙන්ද තවදුරටත් වලංගුව පැවති අතර එයට අතිරේක වශයෙන් රුපියල පවුමට ඈඳනු නොලැබුවහොත් රන් පවුම් කලාපයත් සමග පවත්නා ශ්‍රී ලංකාවේ අපනයනවෙළෙඳාම කෙරෙහි ඉන් අවාසිදයක බලපෑමක් ඇති විය හැකි බව සැලකිල්ලට ගත යුතු විය. මේ අනුව. පවුම සමග ස්ථාවර සම්බන්ධත්වයක් පවත්වා ගැනීමේ පදනම මත රුපියල සඳහාවිනිමය අනුපාතිකයන් 1972 ජූලි 8 වැනි දින ප්‍රතිශෝධනය කරන ලදී. ප්‍රධාන ව්‍යවහාර මුදල්වර්ගයකට අනුකූලව රුපියල ප්‍රතිප්‍රමාණ කිරීමේ අවශ්‍යතාවයක් ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂ තත්ත්වය අනුව ඇති නොවූවද යටකී තීරණයන් ක්‍රියාත්මක කිරීමේ වක්‍ර ප්‍රතිඵලය වූයේ ප්‍රධාන ව්‍යවහාර මුදල් වර්ග අනුව රුපියල මඳ ප්‍රමාණයකින් ක්ෂය වීමය. මෙම ක්ෂයවීම හේතුකොටගෙන, දේශීය අපනයනයන්ට (විශේෂයෙන්ම විදේශ විනිමය හිමිකම සහතිකපත් සඳහා සුදුසුකම් නොලබන අපනයනයන්ට) ඉමහත් සහනයක් සැලසුන අතර ආනයනයන් සඳහා වන ඉල්ලුම මැඩපැවැත්වීමටද එය තරමක් දුරට ඉවහල් විය.

ගෙවීම් ශේෂය කෙරෙහි බලපාන වැදගත් ක්‍රියා මාර්ග දෙකක් නව අයවැය මගින් ඇති කෙරිණි.

(අ) විදේශ විනිමය හිමිකම් සහතික පත් සඳහාවූ අනුපාතිකය සියයට 55 සිට සියයට 65 දක්වා වැඩි කිරීම.

(ආ) කලින් නිදහස් කරන ලද ආනයන ද්‍රව්‍ය රාශියක් විදේශ විනිමය හිමිකම් සහතික යටතට පමුණුවනු ලැබීම.

මෙකී ක්‍රියා මාර්ගයන් දෙක, සම්ප්‍රදයික නොවන අපනයනයන් තවදුරටත් දිරිගැන්වීමටත්, ආනයන සඳහා වන ඉල්ලුම සෑහෙන ප්‍රමාණයකට සමතුලිතව පවත්වා ගැනීමටත් ඉවහල් විය යුතුය.

ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂය සහ විදේශීය වත්කම් පිළිබඳ සවිස්තර සංඛ්‍යා තොරතුරු II වැනි පරිශිෂ්යයේ II (ඌ) 2 සහ II (ඌ) 3 සංඛ්‍යා සටහන් වලින් දක්වේ.

ගෙවුම් ශේෂයේ ප්‍රධාන ශීර්ෂයන් පහත සවිස්තරව විශ්ලේෂණය කර ඇත.

**1971 - 1972**

| | | | රුපියල් |
|---|---|---|---|
| | 1971 | | |
| | හර | බැර | ශුද්ධ |
| **1. වෙළෙඳ ගිණුම** | | | |
| අපනයන (නැ·වි·ස·) .. .. .. | 1,930 | | |
| ආනයන (මි·ර·ගැ·) (ස්ව සම්පත්) .. .. | | 1,708 | |
| (ආධාර ආනයන සහ සැපයුම් කරුවන්ගේ ණය) .. | | 509 | |
| මුළු ආනයන .. .. .. | | 2,217 | |
| වෙළෙඳ ශේෂය (ස්ව සම්පත්) .. .. | | | (+ 222) |
| වෙළෙඳ ශේෂය (සියලුම ආනයන) .. .. | | | − 287 |
| **2. සේවා ගිණුම** | | | |
| මුල්‍ය නොවන රන් .. .. | — | — | — |
| වරාය, ප්‍රවාහණ සහ රක්ෂණ .. .. | 139 | 43 | + 96 |
| විදෙශ සංචාර .. .. | 20 | 15 | + 5 |
| ආයෝජන ආදායම් .. .. | 13 | 134 | − 121 |
| (i) ලාභ සහ ලාභාංශ .. .. | 1 | 30 | − 29 |
| (ii) අනෙකුත් (පොලී) .. .. | 12 | 104 | − 92 |
| රජයේ වියදම් .. .. | 35 | 24 | + 11 |
| විවිධ සේවා .. .. | 106 | 111 | − 5 |
| පෞද්ගලික සංක්‍රාම .. .. | 20 | 40 | − 20 |
| මුළු සේවා .. .. | 333 | 367 | − 34 |
| **3. මුළු ජංගම ගිණුම (ස්ව සම්පත්) .. ..** | (2,263) | (2,075) | (+ 188) |
| මුළු ජංගම ගිණුම (සියළුම ශිෂී) .. .. | 2,263 | 2,584 | − 321 |
| **4. ප්‍රාග්ධන ගෙවීම් .. ..** | — | 1,051 | −1,051 |
| ණය .. .. | — | 96 | − 96 |
| සැපයුම්කරුවන්ගේ ණය .. .. | — | 65 | − 65 |
| කෙටිකාලින ණය .. .. | — | 614 | − 614 |
| තෙල් වන්දි සහ ආසියානු සංවර්ධන බැංකුව .. .. | — | 10 | − 10 |
| පෞද්ගලික ප්‍රාග්ධනය .. .. | — | 36 | − 36 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල .. .. | — | 145 | − 145 |
| බැංකු ණය .. .. | — | 81 | − 81 |
| අනෙකුත් .. .. | — | 4 | − 4 |
| මුළු ජංගම හා ප්‍රාග්ධන ගෙවීම් (ස්ව සම්පත්) .. .. | | | (− 863) |
| මුළු ජංගම හා ප්‍රග්ධන ගෙවීම් (සියලුම ශිෂී) .. | | | −1,372 |
| **5. මුදල් සැපයීම .. ..** | | | |
| ජා. මූ. අ. හැර ගැනීම් .. .. | 83 | — | + 83 |
| බැංකු ණය .. .. | — | — | — |
| ද්විපාර්ශ්වික ශේෂ .. .. | — | 57 | − 57 |
| සැපයුම්කරුවන්ගේ ණය .. .. | 58 | — | + 58 |
| කෙටි කාලින ණය .. .. | 658 | — | + 658 |
| විදෙශ වත්කම් .. .. | — | 96 | − 96 |
| ද්‍රව්‍යාධාර .. .. | 260 | — | + 260 |
| යෝජනාක්‍රම හා වෙනත් ආධාර .. .. | 86 | — | + 86 |
| වෙනත් ආධාර .. .. | 152 | — | + 152 |
| පරිත්‍යාග .. .. | 105 | — | + 105 |
| පෞද්ගලික ප්‍රාග්ධනය .. .. | 25 | — | + 25 |
| අනෙකුත් .. .. | 41 | — | + 41 |
| විශේෂ හැර ගැනීමේ අයිතීන් .. .. | 63 | — | + 63 |
| වැරදීම් හා අත්හැරීම් .. .. | — | 6 | − 6 |
| මුළු මුදල් සැපයීම් .. .. | 1,531 | 159 | +1,372 |

(අ) තාවකාලිකයි.

සංඛ්‍යා. කිට්ටුම පූර්ණ සංඛ්‍යා වලින් දක්වා ඇත.

## II (ඌ) 2 සංඛ්‍යා සටහන

### ගෙවුම් ශේෂය

| දශ ලක්ෂ | | | එ. ජ. ඩොලර් දශ ලක්ෂ | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 1 9 7 2 (අ) | | | 1 9 7 1 | | | 1 9 7 2 (අ) | | |
| හර | බැර | ශුද්ධ | හර | බැර | ශුද්ධ | හර | බැර | ශුද්ධ |
| 1,963 | | | 324 | | | 318 | | |
| | 1,697 | | | 287 | | | 275 | |
| | 568 | | | 85 | | | 92 | |
| | 2,265 | | | 372 | | | 367 | |
| | | (+ 266) | | | (+ 37) | | | (+ 43) |
| | | − 302 | | | − 48 | | | − 49 |
| — | — | — | — | — | — | | | |
| 138 | 45 | + 93 | 23 | 7 | + 16 | 23 | 7 | + 16 |
| 32 | 13 | + 19 | 4 | 3 | + 1 | 5 | 2 | + 3 |
| 12 | 149 | − 137 | 2 | 22 | − 20 | 2 | 24 | − 22 |
| 1 | 29 | − 28 | — | 5 | − 5 | — | 5 | − 5 |
| 11 | 120 | − 109 | 2 | 17 | − 15 | 2 | 19 | − 17 |
| 40 | 28 | + 12 | 6 | 4 | + 2 | 7 | 4 | + 3 |
| 126 | 128 | − 2 | 18 | 19 | − 1 | 20 | 21 | − 1 |
| 25 | 59 | − 34 | 3 | 7 | − 4 | 4 | 10 | − 6 |
| 373 | 422 | − 49 | 56 | 62 | − 6 | 61 | 68 | − 7 |
| (2,336) | (2,119) | (+ 217) | (380) | (349) | (+ 31) | (379) | 343 | + 36 |
| 2,336 | 2,687 | − 351 | 380 | 434 | − 54 | 379 | (435) | (− 56) |
| — | 952 | − 952 | — | 176 | − 176 | — | 155 | − 155 |
| — | 124 | − 124 | — | 16 | − 16 | — | 20 | − 20 |
| — | 50 | − 50 | — | 11 | − 11 | — | 8 | − 8 |
| — | 570 | − 570 | — | 103 | − 103 | — | 93 | − 93 |
| — | — | — | — | 2 | − 2 | — | — | − |
| — | 38 | − 38 | — | 6 | − 6 | — | 6 | — 6 |
| — | 170 | − 170 | — | 24 | − 24 | — | 28 | 28 |
| — | — | — | — | 14 | − 14 | — | — | — |
| — | — | — | — | — | — | — | — | − |
| | | (− 735) | | | (− 145) | | | (− 119) |
| | | − 1,303 | | | − 230 | | | − 211 |
| 163 | — | + 163 | 14 | — | + 14 | 27 | — | + 27 |
| 12 | — | + 12 | — | — | — | 2 | — | + 2 |
| — | 11 | − 11 | — | 10 | − 10 | — | 2 | − 2 |
| 72 | — | + 72 | 10 | — | + 10 | 12 | — | + 12 |
| 593 | — | + 593 | 111 | — | + 111 | 96 | — | + 96 |
| — | 229 | − 229 | — | 16 | − 16 | — | 37 | − 37 |
| 317 | — | + 317 | 44 | — | + 44 | 51 | — | + 51 |
| 97 | — | + 97 | 14 | — | + 14 | 16 | — | + 16 |
| — | — | — | 25 | — | + 25 | — | — | — |
| 82 | — | + 82 | 18 | — | + 18 | 13 | — | + 13 |
| 51 | — | + 51 | 4 | — | + 4 | 8 | — | + 8 |
| 88 | — | + 88 | 7 | — | + 7 | 14 | — | + 14 |
| 62 | — | + 62 | 10 | — | + 10 | 10 | — | + 10 |
| 6 | — | + 6 | — | 1 | − 1 | 1 | — | + 1 |
| 1,543 | 240 | +1,303 | 257 | 27 | +230 | 250 | 39 | +211 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## II (උ෧) 3 සංඛ්‍යා සටහන

### විදේශීය සම්පත් සහ ඒවා යෙදවූ අයුරු

| ශීර්ෂ | රුපියල් දශ ලක්ෂ | | | | ප්‍රතිශත කොටස | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1969 | 1970 | 1971 | 1972(අ) | 1969 | 1970 | 1971 | 1972(අ) |
| **අ. සම්පත්** | | | | | | | | |
| 1. වෙළඳ භාණ්ඩ අපනයන (නැ.වී.ස.) | 1,909 | 2,017 | 1,930 | 1,963 | 56 | 58 | 51 | 51 |
| 2. සේවා ගිණුම් | 269 | 234 | 333 | 373 | 8 | 7 | 9 | 10 |
| 3. ප්‍රාග්ධන ලැබීම් | 417 | 382 | 628 | 547 | 12 | 11 | 16 | 14 |
| (අ) ණය[1] | 362 | 299 | 346 | 414 | 11 | 9 | 9 | 11 |
| (ආ) වෙනත් ආධාර[2] | — | — | 152 | — | — | — | 4 | — |
| (ඇ) පරිත්‍යාග[1] | 46 | 75 | 105 | 82 | 1 | 2 | 3 | 2 |
| (ඈ) පෞද්ගලික ප්‍රාග්ධන | 9 | 8 | 25 | 51 | — | — | — | 1 |
| 4. කෙටිකාලීන වගකීම් | 715 | 829 | 903 | 990 | 21 | 24 | 24 | 25 |
| (අ) ජා. මු. අ. හැර ගැනීම් (දළ) | 77 | 57 | 83 | 163 | 2 | 2 | 2 | 4 |
| (ආ) විශේෂ හැර ගැනීමේ අයිතීන් | — | 76 | 63 | 62 | — | 2 | 2 | 2 |
| (ඇ) ද්විපාර්ශ්වික ගෙවුම් සම්මුති ශේෂවල වැඩිවීම | 18 | — | — | — | 1 | — | — | — |
| (ඈ) විදේශ බැංකු වලින් ගැනීම් | 227 | 123 | — | 12 | 7 | 4 | — | — |
| (ඉ) කෙටිකාලීන ණය | 185 | 434 | 658 | 593 | 5 | 13 | 17 | 15 |
| (ඊ) සැපයුම්කරුවන්ගේ ණය | 176 | 85 | 58 | 72 | 5 | 2 | 2 | 2 |
| (උ) වෙනත් | 32 | 52 | 41 | 88 | 1 | 1 | 1 | 2 |
| 5. (රන් පවුම් ණය නිදන් අරමුදල හැර) විදේශ වත්කම් අඩුවීම | 90 | — | — | — | 3 | — | — | — |
| **එකතුව** | **3,399** | **3,462** | **3,794** | **3,873** | **100** | **100** | **100** | **100** |
| **ආ. යෙදවූ අයුරු** | | | | | | | | |
| 6. වෙළඳ භාණ්ඩ ආනයන (මි.ර.ගැ.) | 2,655 | 2,332 | 2,217 | 2,265 | 78 | 67 | 58 | 58 |
| ඒවායින්-ආධාර | 581 | 459 | 509 | 563 | 17 | 13 | 13 | 15 |
| 7. සේවා ගිණුම් | 366 | 364 | 367 | 422 | 11 | 11 | 10 | 11 |
| (අ) ආයෝජන ආදයම | 120 | 152 | 134 | 149 | 4 | 4 | 3 | 4 |
| (ආ) සංක්‍රමණික සංක්‍රාම | 15 | 23 | 40 | 59 | 1 | 1 | 1 | 2 |
| (ඇ) පොලී ගෙවීම් | 10 | 100 | 104 | 120 | 2 | 3 | 3 | 3 |
| 8. ප්‍රාග්ධන ගෙවීම් | 87 | 126 | 132 | 162 | 2 | 3 | 3 | 4 |
| (අ) නිල | 77 | 113 | 96 | 124 | 2 | 3 | 2 | 3 |
| (ආ) පෞද්ගලික | 10 | 13 | 36 | 38 | — | — | 1 | 1 |
| 9. කෙටිකාලීන වගකීම් | 305 | 605 | 976 | 801 | 9 | 18 | 26 | 2 |
| (අ) ජා. මු. අ. ප්‍රතිමිලට ගැනීම් | 87 | 161 | 145 | 170 | 3 | 5 | 4 | 4 |
| (ආ) ද්විපාර්ශ්වික ගෙවුම් සම්මුති ශේෂවල අඩුවීම | — | 75 | 57 | 11 | — | 2 | 2 | — |
| (ඇ) බැංකු ණය | — | — | 81 | — | — | — | 2 | — |
| (ඈ) කෙටි කාලීන ණය | 147 | 282 | 614 | 570 | 4 | 8 | 16 | 15 |
| (ඉ) සැපයුම් කරුවන්ගේ ණය | 50 | 80 | 65 | 50 | 1 | 3 | 2 | 2 |
| (ඊ) වෙනත් | 21 | 7 | 14 | — | 1 | — | — | — |
| 10. (රන්පවුම් ණය නිදන් අරමුදල් හැර) විදේශ වත්කම් වැඩිවීම | — | 39 | 77 | 183 | — | 1 | 2 | 5 |
| 11. සමතුලිත ශේෂය | – 14 | – 4 | 25 | 40 | — | — | 1 | 1 |
| **එකතුව** | **3,399** | **3,462** | **3,794** | **3,873** | **100** | **100** | **100** | **100** |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලිකයි

1. යෝජනාක්‍රම ආධාර සහ ද්‍රව්‍යාධාරවල වරුපයෙන් ලැබුණු ආධාර ඇතුලත්වේ.

2. චීන ජනජන සමූහාණ්ඩුවෙන් ලැබුණ ව්‍යවහාර මුදල් ණය.

සංඛ්‍යා කිට්ටුම පූර්ණ සංඛ්‍යාවලින් දක්වා ඇත.

(අ) වෙළෙඳ භාණ්ඩ ගිණුම

වෙළෙඳ භාණ්ඩ ගිණුමෙහි වූ රුපියල් දශලක්ෂ 287 ක අවාසිදායක ශේෂය 1972 දී රුපියල් දශලක්ෂ 302 දක්වා වැඩිවී ඇතැයි ඇස්තමේන්තු කර තිබේ. හිඟයේ වැඩි ප්‍රමාණය කට හේතුවී ඇත්තේ ආනයන වියදම් ඉහළ යාමය. ආනයන ප්‍රමාණය අඩුකර තිබියදීත් ආනයන වියදම් 1971 දී රුපියල් දශලක්ෂ 2,218 සිට 1972 දී රුපියල් දශලක්ෂ 2,265 දක්වා සියයට 2.1 කින් වැඩි වී ඇතැයි ඇස්තමේන්තු කර තිබෙ කලින් දැක්වූ පරිදි වියදම වැඩි වීමට තරමක් දුරට හේතුවී ඇත්තේ විනිමය අනුපාතිකයන් පිළිබඳ ගැලපිලි කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ආනයනයන් සඳහා අධික රුපියල් වටිනාකමක් අදළ වීමය. ආනයනයන්හි විදේශීය මිළ ගණන් වැඩිවීමද මෙයට තරමක් දුරට හේතුවී ඇත.

අපනයන ඉපැයීම් රුපියල් දශලක්ෂ 1930 සිට රුපියල් දශලක්ෂ 1963 දක්වා සියයට 1.6 කින් වැඩි විය. අපනයන සම්බන්ධයෙන් ඉපැයීම් වැඩිවීමට මූලික හේතුව වූයේ විනිමය අනුපාතික වෙනස් වීමය. කෙසේ වුවද, විදේශීය ව්‍යවහාර මුදල් අනුව සලකන කළ අපනයන ඉපැයීම් සියයට 1·9 කින් අඩුවී තිබේ. මෙයට හේතුවී ඇත්තේ අපනයන පරිමාව අඩුවීමය.

(ආ) සේවා සහ සංක්‍රාම

සේවා ගිණුම පිළිබඳ ඇස්තමේන්තු II (ඌ) 4 සංඛ්‍යා සටහනෙහි විස්තර කොට දක්වා ඇත. ඉකුත් දෙවසරෙහිදී සේවා ගිණුමේ හිඟයෙහි ඉතා තියුණු අඩුවීමක් දක්නට ඇත. 1971 දී සේවා ගිණුමේ හිඟය රුපියල් දශලක්ෂ 14 දක්වා අඩුවී ඇති අතර ඊට කලින් වර්ෂයේදී හිඟය රුපියල් දශලක්ෂ 102 ක්ව පැවතිණි. 1972 දී එහි හිඟය 1971 දී පැවැති මට්ටමෙහිම පැවතිණි.

රටෙහි පැවැති ත්‍රස්තවාදී ක්‍රියාවන් හේතුකොටගෙන සංචාරක ව්‍යාපාරයෙන් වූ ලැබීම් මඳ වශයෙන් පිරිහුණද නැවතත් එම ලැබීම්වල දියුණුවක් ඇති වන බවට නියත වශයෙන්ම ලකුණු පහළ වී තිබේ. මෙම ලැබීම් රුපියල් දශලක්ෂ 20 සිට රුපියල් දශලක්ෂ 32 දක්වා වැඩි වනු ඇතැයි ඇස්තමේන්තු කර තිබේ. ගෙවීම් පක්ෂය අනුව බලන කල ආයෝජන ආදායම් මාර්ගයෙන් වූ විශාල ගලා යැමට මූලික වශයෙන් හේතුවූයේ වැඩි වෙමින් පවත්නා ලංකා විදේශීය ණය සඳහා ගෙවිය යුතුවූ විශාල පොළී ප්‍රමාණයයි.

II (ඌ) 4 වෙනි සංඛ්‍යා සටහන

සේවා ගිණුමේ ප්‍රධාන අංශ වල වූ වෙනස් වීම්

1971 සහ 1972

රුපියල් දශලක්ෂ

| | බැර | | | හර | | | ශේෂය | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1971 | 1972(අ) | වෙනස | 1971 | 1972(අ) | වෙනස | 1971 | 1972(අ) |
| වරාය ප්‍රවාහණ සහ රක්ෂණ .. | 139 | 138 | − 1 | 43 | 45 | 2 | + 96 | + 93 |
| විදේශ සංචාර .. | 20 | 32 | 12 | 15 | 13 | − 2 | + 5 | + 19 |
| ආයෝජන ආදායම් .. | 13 | 12 | − 1 | 134 | 149 | 15 | −121 | −137 |
| (i) ලාභ සහ ලාභාංශ .. | 1 | 1 | — | 30 | 29 | − 1 | − 29 | − 28 |
| (ii) පොළී .. | 12 | 11 | − 1 | 104 | 120 | 16 | − 92 | −109 |
| රජයේ වියදම් .. | 35 | 40 | 5 | 24 | 28 | 4 | + 11 | + 12 |
| විවිධ සේවා .. | 106 | 126 | 20 | 111 | 128 | 17 | − 5 | − 2 |
| පෞද්ගලික සංක්‍රාම .. | 20 | 25 | 5 | 40 | 59 | 19 | − 20 | − 34 |
| එකතුව .. | 333 | 373 | 40 | 367 | 422 | 55 | − 34 | − 49 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලිකයි.

සංක්‍රාම ගෙවුම් පිළිබඳව පෞද්ගලික ගිණුමෙන් අධික ගලායෑමක් ඇති වූයේ ඉන්දු-ලංකා ගිවිසුම යටතේ පෙරලා සියරට යෑවීම වැඩි වේගයකින් සිදු කිරීම බව දැක්විය හැකිය. නිල සංක්‍රාම ගෙවීම් වලින් ලත් ලැබීම් මගින්, මුදල් හෝ භාණ්ඩ ස්වරූපයෙන් විදේශීය රටවලින් ලත් දීමනා පිළිබිඹු වෙයි. මෙවායේ රුපියල් දශලක්ෂ 105 සිට රුපියල් දශලක්ෂ 82 දක්වා පහත වැටීමක් වාර්තා වී තිබේ.

සේවා සහ සංක්‍රාම ගෙවීම් එක්ව ගත් කළ රුපියල් දශලක්ෂ 34 ක අතිරික්තයක් ඇතිවී තිබේ. ඒ මගින් වර්තන ගිණුමේ හිඟය රුපියල් දශලක්ෂ 269 දක්වා අඩුකර ගත හැකි විය.

**(ඇ) ප්‍රාග්ධන ගිණුම**

1972 දී මූලෝපායනය කළයුතුව තිබූ මුළු සම්පත් පරතරය රුපියල් දශලක්ෂ 1303 ක්වූ අතර එය 1971 දී රුපියල් දශලක්ෂ 1,372 ක් වී ඇත. දිගුකාලීන නිල ප්‍රාග්ධන ගලා ඒම (එනම් ද්‍රව්‍යාධාර හා යෝජනා ක්‍රම ආධාර මාර්ගයෙනි) රුපියල් දශලක්ෂ 498 සිට 414 දක්වා පහත වැටී තිබේ. එවැනි ණය මුදල් සඳහා වූ ආපසු ගෙවීම් රුපියල් දශලක්ෂ 96 සිට රුපියල් දශලක්ෂ 124 දක්වා වැඩි විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් නිල දිගුකාලීන, ශුද්ධ ප්‍රාග්ධන ගලාඒම් රුපියල් දශලක්ෂ 402 සිට රුපියල් දශලක්ෂ 290 දක්වා අඩු විය.

දිගුකාලීන ශුද්ධ ප්‍රාග්ධන ගලාඒම්හි පහත වැටීම නිසා කෙටිකාලීන ණය දිගින් දිගටම උපයෝගී කර ගැනීම වැළැක්විය නොහැකි කරුණක් විය. වසර තුළදී ලබාගත් එවැනි ණය රුපියල් දශලක්ෂ 665 ක්වූ අතර 1971 දී එම ප්‍රමාණය රුපියල් දශලක්ෂ 716 ක් විය. කෙසේ වුවද, එවැනි ණය සම්බන්ධයෙන් ආපසු ගෙවීම් රුපියල් දශලක්ෂ 679 සිට රුපියල් දශලක්ෂ 620 දක්වා පහත වැටිණි. මේ අනුව, නොබේරූ කෙටිකාලීන ණය පරිමාව 1972 දී රුපියල් දශලක්ෂ 45 කින් වැඩි විය. 1971 වර්ෂයේ දී වැඩිවී ඇත්තේ රුපියල් දශලක්ෂ 37 කින් පමණි.

**II (ඌ) 5 වන සංඛ්‍යා සටහන**

**විදේශීය සම්පත් පරතරය පියවීමට මුදල් ලබාගත් මාර්ග**

**1971 - 1972**

| | 1971 | | 1972 (අ) | |
|---|---|---|---|---|
| | රු. දශලක්ෂ | ප්‍රතිශත කොටස | රු. දශලක්ෂ | ප්‍රතිශත කොටස |
| සම්පත් පරතරය .. | − 1,372 | | − 1,303 | |
| මුදල් සපයාගත් ආකාරය .. | + 1,372 | 100 | + 1,303 | 100 |
| 1. විදේශ වත්කම් .. | − 96 | − 7·0 | − 229 | − 17·5 |
| 2. විදේශ බැංකු ණය .. | — | — | 12 | 0·9 |
| 3. ජා. මූ. අ. කළ හැර ගැනීම් .. | 83 | 6·0 | 163 | 12·5 |
| 4. ද්විපාර්ශ්වික වෙළෙඳ ශේෂ .. | − 57 | − 4·1 | − 11 | − 0·8 |
| 5. කෙටි කාලීන වෙළෙඳ ණය .. | 658 | 48·0 | 593 | 45·6 |
| 6. සැපයුම්කරුවන්ගේ ණය .. | 58 | 4·2 | 72 | 5·5 |
| 7. ද්‍රව්‍යාධාර .. | 260 | 18·9 | 317 | 24·4 |
| 8. යෝජනාක්‍රම ආධාර .. | 86 | 6·2 | 97 | 7·5 |
| 9. අනෙකුත් ණය සහ ණය මාලා .. | 152 | 11·0 | — | — |
| 10. පරිත්‍යාග .. | 105 | 7·6 | 82 | 6·3 |
| 11. පෞද්ගලික ප්‍රාග්ධනය .. | 25 | 1·8 | 51 | 3·9 |
| 12. සෙසු මාර්ග .. | 41 | 2·9 | 88 | 6·8 |
| 13. විශේෂ ගැනීමේ අයිතීන් .. | 63 | 4·5 | 62 | 4·8 |
| 14. වැරදීම් සහ අත්හැරීම් .. | − 6 | — | 6 | 0·1 |

(අ) තාවකාලිකයි.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

1972අපනයන උච්චාවචනයන්ගේ හානිපූරණය සඳහා වූ මූලෝපායජන ක්‍රමය යටතේ ඒ. ජ. ඩොලර් දශලක්ෂ 14.75 ක ගැනීමක්ද, ඉකුත් වර්ෂයේ සම්පස්ථ ගිවිසුම යටතේ ඒ. ජ. ඩොලර් 10.5 ක ගැනීමක්ද හේතුකොටගෙනමුළු ලැබීම් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 163 විය. රුපියල් වලින් ගෙවිය යුතු ගාස්තු වශයෙන් තවත් රුපියල් දශලක්ෂ 19 ක් ජා.මු අරමුදලට බැර කරනලදී. කලින් කරන ලද ගැනීම් සම්බන්ධයෙන් මුළු ආපසු ගෙවීම් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 170 ක් විය. ජා මු. අරමුදල වෙත වූ ශුද්ධ ණයගැති භාවය මේ අනුව රුපියල් දශලක්ෂ 12 කින් වැඩි වූ අතර මෙයට ප්‍රතිවිරුද්ධ වශයෙන් 1971 වසරේදී මෙම ණයගැති භාවයෙහි රුපියල් දශලක්ෂ 41 ක අඩුවීමක් ඇතිවී තිබිණි.

විශේෂ ගැනීම් අයිතීන්හි මුල් වෙන් කිරීමට අයත් තුන්වැනි වාර්ෂික කොටස් මුදල යටතේ ශ්‍රී ලංකාවට රුපියල් දශලක්ෂ 62 ක් දක්වා ගැණුම් අයිතීන් හිමි විය.

## 2. විදේශීය වත්කම්

ගෙවුම් ශේෂ එලය අවාසිදයක තත්ත්වයක පැවතියදීත් ශ්‍රී ලංකාවේ විදේශීය වත්කම් 1972 දී රුපියල් දශලක්ෂ 187 කින්[1] වැඩිවී ඇත. මහ බැංකුවේ වත්කම් රුපියල් දශලක්ෂ 47 කින් සහ වෙළෙඳ බැංකුවල රුපියල් දශලක්ෂ 135 කින්ද, රජයේ වත්කම් රුපියල් දශලක්ෂ 5 කින්ද වැඩිවී ඇත.

විදේශීය වත්කම් වල වැඩිවීම ගෙවුම් ශේෂ තත්ත්වයෙහි දියුණුවක් පිළිබිඹු කරන්නක් නොවන බව අවධාරණයෙන්ම සඳහන් කළ යුතුය. එම වැඩිවීමෙන් රුපියල් දශලක්ෂ 62 ක් හුදෙක් විශේෂ ගැනීම් අයිතීන්හි වෙන් කිරීම පිළිබිඹු කරයි. වැඩිවීමෙ ශේෂයෙහි ඇතුළත්වූ රුපියල් දශක්ලෂ 68 ක වෙළෙඳ බැංකුවල කෙටිකාලීන වගකීම් වැඩිවීම සහ රුපියල් දශලක්ෂ 46 ක රජයේ කෙටිකාලීන වගකීම් වැඩිවීම ද මෙහිදී සැලකිල්ලටගත යුතුය.

1. II පරිශිෂ්ඨයේ 48 වැනි සංඛ්‍යා සටහන.